සැ.යු. ඃ ශාලාධිපති විසින් මෙම උපදෙස් පත්‍රිකාව දිනපතා උදේ නිරීක්ෂකවරුන්ට බෙදා දී එදින විභාග අවසන් වූ පසු ආපසු ලබා ගත යුතු ය. විභාග අවසාන දිනයේ දී ශාලාධිපති උපදෙස් සංග්‍රහය සමග මෙම උපදෙස් පත්‍රිකා ද DP/A කවරය තුළ බහා ආපසු විභාග දෙපාර්තමේන්තුවට එවිය යුතු ය.

මගේ අංකය ඃ 6/6
පාසල් විභාග සංවිධාන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.
2018.04.04

සියලු ම නිරීක්ෂකයන් වෙත,

## නිරීක්ෂක උපදෙස්

### 1.0 විභාගය ආරම්භ කිරීමට පෙර

1.1 A6 ආකෘතියට අනුව සුදුසුකම් තිබේ නම් පමණක් පත්වීම භාර ගන්න.
1.2 විභාග ශාලාවේ සේවයට පැමිණි මුල් දිනයේ ම ශාලාධිපති ඉදිරියේ රහස්‍යතා දිවුරුම අත්සන් තබන්න.
1.3 විභාග දෙපාර්තමේන්තුවෙන් එවා ඇති සියලු ම උපදෙස් කියවා බලා ඒ ගැන අවබෝධයක් ලබා ගන්න. ශාලාධිපති ජර්නලයේ දෛනික සටහන් තීරුවේ මෙම උපදෙස් කියවූ බවට අත්සන් කරන්න.
1.4 විභාග ශාලාධිපති විසින් නියම කරනු ලබන දිනවල විභාගය ආරම්භ කිරීමට අවම වශයෙන් පැය භාගයකටවත් පෙර මධ්‍යස්ථානය වෙත පැමිණිය යුතු ය.
1.5 විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී ශාලාව තුළ නිල ලාංඡන පැළඳ සිටිය යුතු ය.

### 2.0 විභාගය ආරම්භයේ දී

2.1 එක් එක් වරුවේ දී පැවැත්වෙන විෂයයන් සඳහා ඉල්ලුම් කළ අයදුම්කරුවන් මාධ්‍යය අනුව වෙන් කරන ලද සැසඳුම් ලැයිස්තුවක් ශාලාධිපතිගෙන් ලබා ගන්න.
2.2 ඔබේ සැසඳුම් පත්‍රයේ අයදුම්කරුවන්ගේ විෂයය හා මාධ්‍යය පරීක්ෂා කර ඒ අනුව අවශ්‍ය ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව ශාලාධිපතිට දන්වන්න.
2.3 විභාගය පැවැත්වෙන විට සටහන්, වෙනත් කෙටි සටහන්, රූප සටහන් හා පොත්පත් ආදිය ළඟ තබා ගැනීම තහනම් නිසා විභාගය ආරම්භ වීමට පෙර ඒවා සියල්ල ම ඉවත් කරන ලෙස දැනුම් දෙන්න.
2.4 විභාගය ආරම්භයේ දී ම එක් එක් අපේක්ෂකයා අසුන් ගෙන ඇත්තේ තමන්ට නියමිත ආසනයේ දැයි පරීක්ෂා කර බලන්න.
2.5 උත්තර ලියන පොතේ මුල් පිටුවේ නියමිත ස්ථානයෙහි සහ ඕවර්ලන්ඩ් කඩදාසිවල මුල් පිටුවෙහි දකුණු පස උඩ කෙළවරේ කෙටි අත්සන හා දිනය යොදන්න. එසේ යොදන ලද අත්සන හා දිනය කිසි විටෙක කපා වෙනස් කර නැවත විභාග අපේක්ෂකයන් වෙත නොදෙන්න.
2.6 අත්සන් තබන ලද පිළිතුරු ලියන කඩදාසි අපේක්ෂකයන් වෙත බෙදා දෙන්න. අවශ්‍ය බහුවරණ උත්තර පත්‍ර ප්‍රමාණය තිබේදැයි බලා ඒවා ලබාගෙන සිසුනට බෙදා දෙන්න.
2.7 අදාළ ප්‍රශ්න පත්‍රය බෙදා දීමට පෙර සෑම අපේක්ෂකයකුගෙන් ම අනන්‍යතා පත්‍රය ලබා ගන්න. ඒවා ආපසු දිය යුත්තේ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලයෙන් 2/3 ක් ඉක්ම ගිය පසුව ය.
2.8 පිළිතුරු ලියන කඩදාසිවල විභාග අංකය ලිවීමට උපදෙස් දී එය ඩෙස්ක් එක මත ඇති අංකය හා සැසඳේ දැයි පරීක්ෂා කර බලන්න.
2.9 පිළිතුරු ලියන කඩදාසිවල විභාග අංකය ලියා නොමැති නම් එය ලියවන්න.

### 3.0 ප්‍රශ්න පත්‍ර

3.1 වරු කවරය විවෘත කිරීමට පෙර එහි අංක, විභාග මධ්‍යස්ථානය, දිනය, දවස සහ වරුව නිවැරදි දැයි පරීක්ෂා කර බලා අදාළ ස්ථානයේ අත්සන් කරන්න.
3.2 ප්‍රශ්න පත්‍ර කවරය ශාලාධිපති විසින් විවෘත කිරීමට පෙර එහි විභාග මධ්‍යස්ථාන අංකය කාල සටහන අනුව දිනය, විෂයය, පත්‍රය හා මාධ්‍යය පරීක්ෂා කර බලා නිවැරදි බව තහවුරු කර ගන්න.
3.3 ඔබ වෙත ලැබුණු ප්‍රශ්න පත්‍ර බෙදා දීමට පෙර නැවත වතාවක් දිනය, විෂය, විෂය අංකය, පත්‍රය හා මාධ්‍යය අනුව නිවැරදි දැයි පරීක්ෂා කර බලා නිවැරදි බව තහවුරු කර ගන්න.
3.4 නියමිත වේලාවට ප්‍රශ්න පත්‍ර බෙදා දෙන්න. අදාළ ප්‍රශ්න පත්‍රයේ කඩදාසි කිහිපයක් ඇති විට ඒ කඩදාසි සියල්ලම අපේක්ෂකයන් සියලු දෙනාට ම ලැබී තිබේ දැයි තහවුරු කර ගන්න.
3.5 ප්‍රශ්න පත්‍ර පිළිබඳ ව විශේෂ උපදෙස් හෝ සංශෝධන ඇත්දැයි ශාලාධිපතිගෙන් විමසන්න. එසේ තිබේ නම් ශාලාධිපති විසින් ම එය නිවේදනය කරන ලෙස මතක් කරන්න.

## 4.0 ප්‍රවේශ පත්‍ර

4.1 විභාගය ආරම්භ වී පළමු පැය භාගය ගත වීමට පෙර අපේක්ෂකයන් ලවා ප්‍රවේශ පත්‍ර අත්සන් කරවා ගන්න. බහුවරණ ප්‍රශ්න හෝ කෙටි පිළිතුරු ප්‍රශ්න හෝ ඇතුළත් I වැනි පත්‍රයක දී අපේක්ෂකයන් වෙත ප්‍රශ්න පත්‍ර බෙදා දීමට පෙර ප්‍රවේශ පත්‍ර අත්සන් කරවා ගන්න.

4.2 විභාග අංක අනුපිළිවෙළට එක් අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍ර දීමෙන් අනතුරුව ඔබ ඉදිරියේ ම එම අපේක්ෂකයා ලවා අත්සන් කරවා ගන්න.

4.3 මෙලෙස අත්සන් කරවා ගැනීමේ දී හැඳුනුම්පතෙහි ඡායාරූපය, සහතික කළ ඡායාරූපය හා අපේක්ෂකයාගේ මුහුණේ ස්වරූපය අතර සමානතාව, ප්‍රවේශ පත්‍රයෙහි සහතික කළ අත්සන හා ඔබ ඉදිරියේ තබන ලද අත්සන අතර සමානතාව, ඩෙස්ක් එක මත ලියා ඇති විභාග අංකය, ප්‍රවේශ පත්‍රයේ සඳහන් විභාග අංකය සහ උත්තර පත්‍රයේ විභාග අංකය අතර සමානතාව පරීක්ෂා කර බැලිය යුතුයි. ඒ සියල්ල සමාන නම් ප්‍රවේශ පත්‍රයේ අදාළ ස්ථානයේ ද ඒ අවස්ථාවේ දී ම උත්තර ලියන පොතේ මුල් පිටුවේ ද ඔබගේ කෙටි අත්සන යොදන්න.

4.4 එක් අපේක්ෂකයකුගෙන් අත්සන් ලබාගත් පසු ඊළඟ අපේක්ෂකයා වෙත ගොස් ඉහත 4.3 හි සඳහන් පරිදි ක්‍රියා කරන්න.

4.5 විභාගයට පෙනී සිටීමට නියමිත පුද්ගලයා ම ඒ සඳහා පෙනී සිටින්නේ දැයි විමසිල්ලෙන් බලා යම්කිසි සැකයක් ඇති වුවහොත් වහා ම ශාලාධිපතිට දන්වා ඒ පිළිබඳ කටයුතුවල දී ඔහුට සහාය වන්න.

## 5.0 නිරීක්ෂණය

5.1 ඔබ විභාග ශාලාවේ එක ම තැන රැඳී නොසිට ඔබමොබ ඇවිදිමින් නිරීක්ෂණයේ යෙදෙන්න.

5.2 විභාග අපේක්ෂකයන් පිළිතුරු සපයන අවස්ථාවේදී අමතර ලියන කඩදාසි හෝ වෙනත් ලිපි ද්‍රව්‍ය ඉල්ලා සිටියහොත් අත්සන හා දිනය යොදා නොපමාව සපයන්න.

5.3 එසේ ලබාදෙන ලද කඩදාසිවල විභාග අංකය වහාම ලියවන්න.

5.4 ඔබගේ නිරීක්ෂණය යටතේ සිටින කිසියම් අපේක්ෂකයකුට හදිසි අසනීපයක් නිසා හෝ ශාරීරික අවශ්‍යතාවක් නිසා හෝ විභාග ශාලාවෙන් පිටතට තාවකාලිකව යාමට අවශ්‍ය වුවහොත් නිරීක්ෂකයකු සමග ම යැවිය යුතු ය. ඒ අතර මග දී පිටස්තර පුද්ගලයන් සමග කථා කිරීමට හෝ සටහන් ආදිය බැලීමට හෝ ඉඩ නො දිය යුතු ය.

5.5 විභාග ශාලාව තුළ සම්පූර්ණ නිශ්ශබ්දතාව රැක ගන්න.

5.6 විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරයක් නොමැති ව ආසන වෙනස් කිරීමට ඉඩ නො දෙන්න.

5.7 සටහන් ළඟ තබා ගැනීම. අනුන්ගේ පිළිතුරු පිටපත් කිරීම, පිළිතුරුපත් හුවමාරු කිරීම හෝ වෙනත් අපේක්ෂකයකුට උදව් කිරීම වැනි වංචනික ක්‍රියා හෝ විනය විරෝධී ක්‍රියා හෝ සිදු නොවීමට වග බලා ගත යුතු ය. එවැනි දේ සිදු වේ නම් වහා ම ශාලාධිපතිට දන්වන්න.

5.8 නිරීක්ෂණ කටයුතු කරන අතර අයදුම්කරුවන් සමග ප්‍රශ්න සම්බන්ධව කථා නොකරන්න.

## 6.0 උත්තර පත්‍ර

6.1 විභාගය අවසන් වීමට විනාඩි පහකට පෙර සියලු ම උත්තර පත්‍රවල විභාග අංකය නිවැරදි ව ලියා ඇත්දැයි පරීක්ෂා කරන ලෙසටත් පිටු අංක අනුව උත්තර පත්‍ර නිවැරදි ව අමුණන ලෙසටත් උපදෙස් දෙන්න.

6.2 විභාග අංකය පරීක්ෂා කර බලා සෑම අපේක්ෂකයකුගෙන් ම උත්තර පත්‍ර ලබා ගන්න.

6.3 ඔබ විසින් එකතු කර ගන්නා උත්තර පත්‍ර එක් එක් විෂයය හා මාධ්‍යය අනුව අංක අනු පිළිවෙළට ගණන් කර ශාලාධිපති වෙත භාර දෙන්න.

6.4 දෙපාර්තමේන්තුවට අයත් ලිපි ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාමට අපේක්ෂකයන්ට ඉඩ නොදෙන්න. ඉතිරි ලිපි ද්‍රව්‍ය ශාලාධිපති වෙත භාර දෙන්න.

6.5 උත්තර පත්‍ර ලකුණු ලැයිස්තු අනුව සැසඳීමට ශාලාධිපතිට සහාය වන්න.

6.6 උත්තර පත්‍ර මාධ්‍ය හා විෂය අනුව නිවැරදි ව කවරයේ බහාලීමට ශාලාධිපතිට සහාය වන්න. උත්තර පත්‍ර නිවැරදිතාව තහවුරු කිරීම සඳහා එවා ඇති කහ පැහැති ලේබලය අත්සන් කිරීමට පෙර රහස්‍ය ලේබලය අනුව මධ්‍යස්ථාන අංකය, මාධ්‍යය, විෂයය හා විෂය අංකය නිවැරදි දැයි නැවත පරීක්ෂා කර බලන්න.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

**ඉතා වැදගත් ඃ**
**මෙම පත්‍රිකාව අනිවාර්යයෙන් ම විභාග මධ්‍යස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු අතර විභාග අපේක්ෂකයින් විසින් කියවා අවබෝධ කර ගත යුතු ය.**

මගේ අංකය ඃ 6/6
පාසල් විභාග සංවිධාන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.
2018.04.04

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## විභාග අපේක්ෂකයන් සඳහා නීති

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත යටතේ 20 (අ) හා 20 (ඇ) ඡේද අනුව පනවා ඇති පහත සඳහන් විභාග නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු බව මෙයින් සියලු ම විභාග අපේක්ෂකයන් වෙත දැනුම් දෙනු ලැබේ. මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට පහත සඳහන් දඬුවම් එකකට හෝ ඊට වැඩි ගණනකට හෝ යටත්වීමට සිදුවනු ඇත.

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් වීම
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු වීම
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසි ම විභාගයකට පෙනී සිටීම හෝ තහනම් වීම
(iv) මුළු ජීවිත කාලය තුළදී ම විභාගයකට පෙනී සිටීම තහනම් වීම
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් වීම
(vi) විභාග අපේක්ෂකයාගේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් ඔහුගේ නිසි බලධාරියාට හෝ සේවා යෝජකයාට සැලකර සිටීම හෝ යථෝක්ත ප්‍රසිද්ධ විභාග පනත යටතේ අධිකරණය ඉදිරියට පැමිණ වීම
(vii) නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටිය හොත් පහත සඳහන් දැඩි විනයානුකූල ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කරනු ලැබේ

**(අ) නියම අපේක්ෂකයා හෝ ව්‍යාජ අපේක්ෂකයා හෝ විසින් මීට පෙර මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ විභාගවලට පෙනී සිට ලබාගත් සියලු ම විභාග ප්‍රතිඵල අවලංගු කිරීම.**
**(ආ) නියම අපේක්ෂකයා හෝ ව්‍යාජ අපේක්ෂකයා හෝ දැනටමත් විශ්ව විද්‍යාලයක හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යාපනය ලබන්නේ නම් මෙම විභාග අපේක්ෂකයින්ගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීම හා අනෙකුත් විනයානුකූල ක්‍රියා මාර්ග සඳහා එම ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කිරීම.**

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කුමන අවස්ථාවක දී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් හා සහාය නිලධාරීන් ද සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිසම් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

## නීති

01. සියලු ම විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතිට ද ඔහුගේ සහායකයින්ට ද අනෙක් විභාග අපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස විනීතව හැසිරිය යුතු ය. විභාග ශාලාවට ඇතුලු වන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතු ය.

02. විභාග අපේක්ෂකයෝ විභාග ශාලාධිපතිගේ අධිකාරියට යටත් වෙති. එබැවින් ඔවුන් විභාගය පවත්වා ගෙන යන අතරතුරත් විභාගය පටන් ගැනීමට පෙරත් විභාගය අවසන් වූ විගසත් ශාලාධිපතිගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

03. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය භාගයක් ගත වූවාට පසු මොන ම කාරණයක් නිසාවත් විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. එසේම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වන තුරු විභාග ශාලාවෙන් පිට වී යාමට ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුලු නො කිරීමට ඉඩ තිබේ.

04. සෑම විභාග අපේක්ෂකයකු ම තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම විභාග අපේක්ෂකයකු ම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසි ම ආසනයක වාඩි නොවිය යුතු ය. විභාග ශාලාධිපති ගේ විශේෂ අවසරය නොමැති ව තමන්ගේ ආසනය වෙනස් නොකළ යුතු ය. තමන්ට නියම නොකරන ලද විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටීම, නියම කරන ලද මධ්‍යස්ථානයක නියම නොකරන ලද අසුනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබේ.

05. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග කතාබස් කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතා කිරීම අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතිගේ අවසරය ලබාගත යුතු ය.

06. විභාග අපේක්ෂකයන් විභාග මධ්‍යස්ථානයේදී තම අනන්‍යතාව තහවුරු කළ යුතු ය. ඒ සඳහා උපදෙස් දී ඇති පරිදි පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් වලංගු වේ. මෙම හැඳුනුම්පත්‍ර ඉදිරිපත් කිරීමට අපොහොසත් අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය පිළිබඳ විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත.

07. විභාග අපේක්ෂකයන් ප්‍රවේශ පත්‍රයෙහි තම අත්සන ඒ සඳහා සුදුසුකම් ඇති පුද්ගලයකු ලවා සහතික කර ඉදිරිපත් කළ යුතු ය. එසේ අත්සන සහතික කර ගැනීමකින් තොරව ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කරන අපේක්ෂකයන්ගේ අපේක්ෂකත්වය පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

08. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම නොකළ යුතු ය. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වනු ඇත. තමන්ට ලබා දී ඇති ප්‍රශ්න පත්‍රයට අදාළව සපයන ලද පිළිතුරු පත්‍ර සියල්ල පිටු අංක අනුව ගොනු කර එක් පිළිතුරු පත්‍රයක් වශයෙන් නියමිත විභාග කාලය අවසානයේ දී ශාලාධිපතිට භාරදිය යුතු ය. ඉන්පසු ලැබෙන කිසිදු පිළිතුරු පත්‍රයක්, කඩදාසියක් හෝ කොටසක් භාරගනු නොලබන බව තරයේ සැලකිය යුතු ය.

09. තමන් වෙත සපයන කඩදාසියෙහි හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසිම තැනක හෝ කිසිවක් ලිවීම නොකළ යුතු ය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුක්ත ව ක්‍රියා කිරීමකැයි සලකනු ලැබේ.

10. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නවා දැමීම හෝ අකා මකා දැමීම නොකළ යුතු ය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුලු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතු ය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය. ) විභාග ශාලාවේදී ලියන ලද කිසි ම දෙයක් ඉන් පිටත ගෙන යෑම තහනම් ය. උත්තර පත්‍රයෙහි කොටස් පිටතට ගෙන ගොස් නැවත එකතු කිරීමට ඉඩදෙනු නොලබන අතර, එසේ කිරීමද දඬුවම් ලැබිය හැකි වරදකි. එක ම ප්‍රශ්නයට, පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සලකනු ලැබේ.

11. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණන් කිසිසේත් නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කලා විෂයයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට අල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ සමාන ව හෝ බොහෝ සෙයින් ආසන්න ව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකි ය.

12. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙනයාම තහනම් ය. මේ සියලු ම දෑ විභාග කොමසාරිස් ජනරාල් සතු ය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වනු ඇත.

13. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත් පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන සටහන් පොත්, අභ්‍යාස පොත් හෝ කඩදාසි හෝ කඩදාසි කැබලි ද (පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය විටක පමණක් භාවිත කළ හැකි තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි හැර) අත් බෑග්, මුදල් පසුම්බි, පෙට්ටි හා ගණක යන්ත්‍ර සහිත ඔරලෝසු, සෙලියුලර් දුරකථන හා වෙනත් ඉලෙක්ට්‍රොනික උපකරණ ද, පාර්සල් ආදිය ද ෆයිල් කවර, කාඩ්බෝඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද විභාග ශාලාව තුළ සිටින කිසි විටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. ගණක යන්ත්‍ර සහ මකන දියර (Correcting Fluid) භාවිතයට ද ඉඩ දෙනු නොලැබේ. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

14. විභාග ශාලාව තුළ කිසි ම අපේක්ෂකයකු අත හෝ තමා සමීපයෙහි කුමන හෝ පොතක් පතක්, සටහන් පොතක්, සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම් ය. විභාග ශාලාධිපති නියම කළ හොත් තමන් සන්තක ව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට සෑම අපේක්ෂකයකු ම බැඳී සිටී. මේ අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට තැත් කිරීමක් ලෙස සලකනු ලැබේ.

15. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ උපුටා ගෙන වංචනික ලෙස උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද වංචනික ලෙස උත්තර ලිවීමට ප්‍රයත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතු ය. වෙන අයදුම්කරුවකුට උදව් දීමෙන් ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතු ය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතු ය. ලියන ලද කඩදාසි, මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

16. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොන ම කරුණක් නිසා හෝ ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි ම විභාග අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් ඉතාමත් ම හදිසි කරුණක් නිසා විභාග අපේක්ෂකයකුට ශාලාවෙන් පිටත යාමට අවශ්‍ය වුවහොත් විභාග ශාලාධිපතිගේ හෝ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂණය යටතේ විභාග ශාලාවෙන් ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතු ය.

17. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු වරදකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම හෝ කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීම හෝ දැඩි දඬුවම් ලැබෙන වරදවල් ය.

18. විභාග අපේක්ෂකයකුට වෙනත් අපේක්ෂකයකු හෝ අපේක්ෂකයකු නොවන අන් කිසිවකු හෝ අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

19. විභාග අපේක්ෂකයකු යම් විභාගයකට පෙනී සිටීම සඳහා ඉල්ලුම් පත්‍ර එකකට වඩා ඉදිරිපත් කර තිබීම බරපතල වරදක් වන අතර, එවැනි විභාග අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අවලංගු කරනු ලැබේ.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්